
# අනුරාධපුර පෞරාණික නගරය.









# අනුරාධපුර පෞරාණික නගරය

**අනුරාධපුරය,** යනු ශ්‍රී ලංකාවේ පෞරාණික අගනුවරකි. ශ්‍රී ලංකාවේ මුල්ම රාජධානිය හා මුල්ම අගනුවරද මෙය වේ. අනුරාධපුර නගරය මේ වන විට යුනෙස්කෝ ලෝක උරුම නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

ශ්‍රී ලංකාවේ උතුරු දිග තැනිතලාවේ මුහුදු මට්ටමින් අඩි 295 ක් පමණ උසින් අනුරාධපුරය පිහිටා තිබේ. අද උතුරු මැද පළාතේ අග නගරයයි. අනුරාධපුරය, වත්මන් අගනුවර වන කොළඹ නගරයේ සිට කිලෝමීටර් 205ක් පමණ උතුරින් උතුරු මැද පළාතේ මල්වතු ඔය අසබඩ පිහිටා ඇත. අනුරාධපුරය ශ්‍රී ලංකාවේ දීර්සතම රජධානියයි. ක්‍රිස්තු පූර්ව 4 වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ 11වන සියවස දක්වා අනුරාධපුර රාජධානියේ එනම් සිංහලේ අගනුවර වශයෙන් පැවතුනි. එම කාලය තුල දකුණු ආසියාවේ ඉතාම බලවත් සහ ස්ථාවර සහ කල්පවත්නා දේශපාලනික පාලන තන්ත්‍රයක් හා ජනජීවිතයක් පැවතුනි. එමෙන්ම එය ඉතා පොහොසත්, අනභිබවනීය සංස්කෘතියක් සහිත ශ්‍රේෂ්ඨ ශිෂ්ටාචාරයක් වී තිබුණි. දැනට වර්ග කිලෝමීටර 40කින් පමණ සමන්විත, විහාරාරාම විශාල ප්‍රමාණයකින් වටවුනු අනුරාධපුර පෞරාණික නගරය බෞද්ධ ලංකාව තුල ඉතා වැදගත් හා පූජනීය ස්ථානයක් ගනී. ලංකාවේ ප්‍රධානතම පුරා විද්‍යා ස්ථාන වලින් එකක් ලෙස අනුරාධපුර පෞරාණික නගරය හඳුන්වා දිය හැක.

ක්‍රි.පු 4 වැනි සියවසේ ආරම්භ වී 11 වැනි සියවස දක්වා අනුරාධපුර රාජධානියේ අගනුවර ලෙස අනුරාධපුරය පැවතුනේය. මෙම කාලය තුල දකුණු ආසියාවේ දේශපාලන බලය හා නාගරික ජීවිතය සම්බන්ධයෙන් ගත් කළ වඩාත් ස්ථාවරව හා කල්පැවතුනු මධ්‍යස්ථානය ලෙස සැලකින. අනුරාධපුරය වර්ග සැතපුම් 16 ක් පුරා පැතිරුණු නගරයකි.

## ➢ ආරම්භය



අනුරාධපුරයෙහි සැලැස්ම මහාවංශයෙහි විස්තර කෙරෙන්නනේ මෙසේය.

ක්‍රි.පූ 4 සියවසෙහිදී පණ්ඩුකාභය රජතුමන් විසින් අනුරාධපුරය අගනගරය බවට පත් කරන ලද බවත්, මනා සංවිධිත සැලසුමක් අනුව නගරය සහ එහි උප නගරයන්ද පිහිටුවන ලද බවත් කියැවේ. "අභය වාපි" හෙවත් අභය වැවද එතුමන් විසින් කරවන ලදී. කාලවේල සහ චිත්තරාජ නමැති යක්ෂයන් උදෙසා දෙවොල්ද කරවනු ලැබීය. චේතියා නමැති යක්ෂණිය උදෙසා වෙළඹකගේ ස්වරූපයෙන් වූ පිළිරුවක් රාජ මාළිග පරිශ්‍රයේම ඉදි කරවන ලද අතර මේ සියළු යක්ෂ-දේවතාවන් උදෙසා වාර්ෂිකව පුද පූජා පැවැත්වීමද සිදු විය. නගරයේ සුසාන භූමිය, වදක භූමිය, පශ්චිම රාජිණියගේ දෙවොල, වෙස්සවණ උදෙසා වූ නුග රුක, ව්‍යාධදේව උදෙසා වූ තල් රුක, යෝනයන් සඳහා වාස භූමිය, ආත්ම පූජා මන්දිරය ආදිය පිහිටැවිය යුතු තැන්ද මෙතුමන් විසින් නියම කරන ලදී. වහලුන් නොහොත් චණ්ඩාලයන් විසින් කළ යුතු කාර්යයන් නියම කෙරුණු අතර ඔවුන් උදෙසා ග්‍රාමයක් වෙන් කරන ලදී. නිඝණ්ටයන්, තැන තැන සරන තවුසන්, ආජීවකයන් සහ බ්‍රාහ්මණයන් උදෙසා වාසස්ථාන ගොඩ නඟන ලදී. ග්‍රාම සීමාද නිර්ණය කරනු ලැබීය. අනුරාධපුරය අග නගරය බවට පත් කරමින් ක්‍රි.පූ 4 සියවස තරම් ඈත යුගයකදී පණ්ඩුකාභය රජතුමන් විසින් බිහි කරනු ලැබූ සම්ප්‍රදාය ඉතා වැදගත් වේ.

නගරයට සහ පූජනීය ස්ථානයන්ට කරනු ලැබූ සනීපාරක්ෂක සහ පරිපාලනමය සම්පාදනයන් විසින් පෙන්නුම් කෙරෙනුයේ කාලාන්තරයක් තිසසේ නගරය කිසියම් මධ්‍යගත සැලැස්මකට අනුව සංවර්ධනය කෙරුණු බවය. පණ්ඩුකාභය රජතුමන්ගේ ඇවෑමෙන් එතුමන්ගේ පුත් මුටසීව රාජපදප්‍රාප්ත විය. හැට වසරක් වූ එතුමන්ගේ රාජ්‍ය පාලන කාලය තුළ අනුරාධපුර නගරය තවදුරටත් අගනුවර වශයෙන් පවත්වා ගත් අතර, බුදු සමය දිවයිනට හඳුන්වා දෙනු ලැබූ මුල් අවදියේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබූ "මහාමේඝවන උද්‍යානය" (හෙවත් මහමෙවුනා උයන) පිහිටුවාලීමද එසමයෙහි සිදුවිය. බුදු රජාණන් වහන්සේගේ පිරිනිවන් පෑමෙන් වසර 236 කට පසු ශ්‍රී ලංකාවට බුදු සමය හඳුන්වාදෙන ලද්දේ මුටසීව රජතුමන්ගේ ඇවෑමෙන් රාජ්‍යත්වයට පත් එතුමන් පුත් දේවානම්පියතිස්ස රාජ්‍ය සමයෙහිදීය. ඉන්දියාවෙහි විසූ අශෝක අධිරාජයා දේවානම්පියතිස්ස රජතුමන්ගේ සමකාලීනයෙක් විය. මෙම කාලය ක්‍රි.පූ 250 - 210 අතර කාලයයි. ලංකාවෙහි රාජ්‍යත්වයෙහි ආරම්භය සහ ආසියාවෙහි විශිෂ්ඨතම ආගමක් වූ බුද්ධ ධර්මය මත පදනම් වූ ශිෂ්ඨාචාරයක ආරම්භයද සනිටුහන් කෙරෙන්නේ මෙසමයෙහිය.

➢ **බුද්ධාගම සහ අනුරාධපුරය**



බුදු දහමේ හඳුන්වා දීමත් සමඟම මෙම නුවර විසල් කැපීපෙනීමක් ලැබුවාක් මෙන්ම මහා ඉදිකිරීම් යුගයක් ද ඇරඹුනි. මහා වංශය පවසන්නේ කූටකන්න තිස්ස රජු විසින් රියන් හතක් උස තාප්පයක් ජල අගලක් ඉදිරියෙන් පවතින පරිදි පලමු තාප්පය ඉදිකළ බවයි. පසුව වසභ රජු විසින් මෙය රියන් 11 සිට රියන් 18 දක්වා උස්කොට තවදුරටත් බලවත් කරන ලදි. එසේම රජු විසින් ශක්තිමත් දොරටු නිවස්න, වාසල් කඩ ඉදි කර ඇති අතර ඒවායෙහි නටබුන් අදද දැකිය හැක. මහා වංශය තව දුරටත් පවසන්නේ ඉදිකිරීම් හිදී නිමිති කියන්නන් සහ වාස්තු විදුවන් ගේ උපදෙස් ලැබූ බවය.

දේශාටනයේ යෙදුන සුප්‍රකට ෆාහියන් හිමියන්ගේ වාර්තාවලට අනුව මෙම නගරයේ සැලැස්ම හා ගොඩනැගීම දුටු උන්වහන්සේ අතිශය මවිතයට පත් වී ඇත. උන්වහන්සේ සඳහන් කරන අන්දමට නගරයේ ජනයා වසය කළ ප්‍රදේශය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදී පැවතුනි. එක් කොටසක් වෙළඳුන්ට සහ අනිත් කොටස කෘෂිකර්මාන්තයෙන් යැපුන සමාන්‍ය ජනතාවටය. වෙනත් මූලාශ්‍රවලින් මෙම වෙළෙන්ඳන් ගැන තවත් විස්තර ලැබී ඇත. මෙහි සඳහන් වෙළඳුන්ගේ නිවාස ඉතා හොඳ තත්වයේ පොහොසත් ගණයේ ලා සැලකිය හැකි නිවාස විය. සමහර වෙළඳුන් විදේශිකයන් වූ අතර ඔවුන් දක්ෂිණ භාරතීය, මධ්‍යධරණී ප්‍රදේශ වලින් පැමිණියවුන් හා පර්සියානුවන් ලෙස හඳුනාගත හැක.

මහාවංශය සඳහන් කරන පරිදි දේවානම්පිය තිස්ස රජතුමා සංඝයා වහන්සේලාගේ උපෝසථ කර්ම සඳහා අවශ්‍ය වන සීමාමාලක ආදිය නිමකරවා දී ඇත. රජතුමා හා වැසියන් බුදුරජාණන් වහන්සේගේ දර් ශනය

මත පිහිටා ජීවත් විය යුතු බව එතුමා තදින් විශ්වාස කළේය. බෞද්ධ විහාරාරාම ප්‍රසාද මන්දිර තැනීම ඇරඹීම සඳහා දේවානම්පිය තිස්ස රජතුමා විසින් මහාමේඝ උයනේ සීමා ලකුණු කර තැබීය.


## ➢ අනුරාධපුර පූජා නගරය හා අනුරාධපුර නව නගරය

නිශ්ශංක විජයරත්න 1958 සිට 1962 දක්වා සේවය කළේ අනුරාධපුරය දිසාපතිවරයා ලෙසය. ඒ අනුරාධපුර නව නගරය ඉදි වෙමින් තිබූ කලබලකාරී අවධියයි. අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා වූ විජයරත්න මහතා පූජා නගරය ප්‍රතිසංවිධානය කිරීමට කටයුතු කළේය. පූජා නගරය තුළ ඉදි කර තිබූ අන්‍යාගමික ගොඩනැගිලි සාකච්ඡා මාර්ගයෙන් ඉන් ඉවතට ගෙන ගොස් ඉදි කිරීමට පියවර ගත්තේය. නටබුන් සහිත පූජා භූමියේ පදිංචිකරුවන් නව නගරයේ පදිංචි කරවා පූජා භූමිය තුළ නිදහසේ වන්දනා කිරීමට අවශ්‍ය පරිසරය සකස් කළේය. එනිසා අදටත් අනුරාධපුරය අටමස්ථානය වන්දනා කරනන්ට යන බැතිමතුන්ට අවහිරයකින් තොරව වතාවත් කිරීමට අවකාශ ලැබී ඇත්තේ ඒ හේතුවෙනි.

එපමණක් නොව 25000ක් පමණ දෙනාට සැලසුම කර තිබූ නව නගර සැලැස්ම ලක්ෂයක් ජනතාව වෙනුවෙන් පුළුල් කිරීමට ද ඔහු කටයුතු කළේය. අනුරාධපුරයට ඇතුළුවීම සඳහා පාලම් දෙකක් ඉදි කළේය. ඇතැම් විරෝධතා නොතකා අනුරාධපුර ගුවන් තොටුපළ ඉදි කිරීමේ වගකීම ද ඉටු කළේය.




© Sahan Perera



# නිමි.

# Team Members

- Rashmika Viraj
- Thilini Rukshanthi
- Shashini Sithara
- Samadhi kavindhya
- Kalpani Rashibrabha
- Thakshila Gihani